අවසන් දිනය- **2025.09.02**

# ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

"මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ (KMTTDP)" මතු සඳහන් තනතුර සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිත්‍ය නිලධරයන් ද ඇතුළුව සියලුම ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ අරමුණෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මහනුවර ප්‍රදේශය පදනම් කර ගනිමින් ස්ථාපිත කර ඇත. මෙම පත්වීම් 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධානවලට යටත් වනු ඇත

**ව්‍යාපෘතියේ නම – මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය**
**(ඇමරිකානු ඩොලර් මිලියන 50-100 කාණ්ඩය)**

| අංකය | තනතුරු නාමය | කළ.සේ. චක්‍රලේඛ අංක 01/2019 අනුව වැටුප් කාණ්ඩය/PS | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ ප්‍රවාහන නිලධාරි | PS - 05 | 01 |

- **ජ්‍යෙෂ්ඨ ප්‍රවාහන නිලධාරි (PS 5 කාණ්ඩය) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්**

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019 (ඇමුණුම 01) අනුව, ජ්‍යෙෂ්ඨ ප්‍රවාහන නිලධාරි (PS 5) (ඇමරිකානු ඩොලර් මිලියන 50-100 කාණ්ඩය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [පහත (1) හෝ (2) හෝ (3)]**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

හෝ

- තාක්ෂණික ක්ෂේත්‍රයට අයත් තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම්වල 7 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- විශේෂීකරණය වීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04ක පළපුරුද්ද

2.

- තාක්ෂණික ක්ෂේත්‍රයට අයත් තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම්වල 6 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- විශේෂීකරණය වීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද

3.

- තාක්ෂණික ක්ෂේත්‍රයට අයත් තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම්වල 5 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- විශේෂීකරණය වීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14ක පළපුරුද්ද

**සාමාන්‍ය කොන්දේසි :**

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් තනතුරකට වැඩි ගණනකට අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙන ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධරයන් සඳහා අවුරුදු 60ට අඩු
- අනෙක් අයවලුන් සඳහා අවුරුදු 64ට අඩු

**02. වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.

- අයදුම්කරු දැනටමත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා

චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.

- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ අයදුම් පත සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.

- සේවා දිගු ලබා දීමේ සහ පත්වීම් ප්‍රදානය කිරීමේ තීරණය, චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තතතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ පදනමේ නිර්දේශය ද සහිතව ආයතනයේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ).

**05. අයදුම්පත යොමු කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, මූලික උපාධියේ සවිස්තරාත්මක උපාධි සහතිකය (transcript), සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද සමග **2025.09.02 දිනට හෝ එදිනට පෙර ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට අතින් ගෙනවිත් භාර දිය හැකි ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න.

**06. විශේෂ අවධානය සඳහා**

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි.**

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම

වැඩිදුර විමසීම් සඳහා 0112050522

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**